20 AUG 2014

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 10 කාණ්ඩය 1 2013 ජූනි

## පාංශු පුනරුත්ථාපනයට මානා හා ගෞතමාලාවලට අමතරව නව තෘණ විශේෂ දෙකක් හඳුන්වාදීමට යයි!

තේ නැවත වගාවට පෙර පාංශු පුනරුත්ථාපනය කිරීම අත්‍යාවශ්‍යයෙන්ම සිදුකළයුතු වුවත්, එය මගහරිමින් කෙලින්ම නැවත තේ වගා කිරීමට බොහෝ තේ ඉඩම් හිමියන් පෙළඹී සිටීම නොරහසකි. මෙයට හේතු ලෙස ඔවුන් ,වසන්නේ පාංශු පුනරුත්ථාපනයේ දී මාස 18-24 වැනි දිගු කාලසීමාවක් තුළ කිසිදු ආදායමක් නොමැතිව කල් ගත කරන්නට සිදු වීමයි. තවද බොහෝ පහතරට ප්‍රදේශවල මානා තෘණ සුලභ නොවීම හා ගෞතමාලා වගා කිරීම තුලින් වටපණු ආසාදනය වීමට ඇති හැකියාව ද මෙහිලා යම් දායකත්වයක් දක්වන බව පෙනේ.



හයිබ්‍රිඩ් නේපියර්(ප්‍රභේදය සී ඕ 3)

මෙයට පිළියම් ලෙස හඳුනාගත හැක්කේ පාංශු පුනරුත්ථාපනය නොකර නැවත තේ වගාකිරීමට හැකි සරු ඉඩම් හඳුනාගැනීම හා තෘණ වගා කලයුතු කාලසීමාව කෙටි කරගැනීමයි. පාංශු පුනරුත්ථාපනය සඳහා වඩාත් සුදුසු වෙනත් තෘණ ශාක වගා කිරීම තුළින් මෙම අරමුණ ශාක්ෂාත් කර ගැනීමට ඇති හැකියාව අධ්‍යනය කිරීම සඳහා ක්ෂෙත්‍ර පරීක්ෂණ පහතරට ගාල්ල හා රත්නපුර ප්‍රදේශවලදී සිදුකරන ලදී. මේ සඳහා මානා හා ගෞතමාලා වලට අමතරව නව තෘණ විශේෂ වන 'හයිබ්‍රිඩ් නේපියර්' (සී ඕ 3 ප්‍රභේදය CO3) හා 'ලෙමන් ග්‍රාස්' ප්‍රභේද අත්හදාබලන ලදී. මෙම ප්‍රභේද දෙකම පහතරට ප්‍රදේශයේ ඉතා හොඳින් වගා කිරීමට හැකි බව නිරීක්ෂණය කරන ලදී. තවද හයිබ්‍රිඩ් නේපියර් විශේෂය වගාකොට මාස 15ක් වැනි කෙටි කාලසීමාවකදී වාර 5 ක් කපා දැමීම තුළින් (Lopping) මානා හා ගෞතමාලා වලට වඩා විශාල තෘණ අස්වැන්නක් ලබාගත හැකි බව අනාවරණය විය. එමගින් පාංශු පුනරුත්ථාපනය සඳහා වැඩි කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයක් කෙටි කලක් තුළදී සැපයේ. එමෙන්ම ලෙමන් ග්‍රාස් විශේෂයද මානා හා සමානව තෘණ අස්වැන්නක් ලබා දීමට සමත් විය.

එක් එක් තෘණ විශේෂ ලබාදුන් පත්‍ර හා මුල් අස්වැන්න වගු අංක 1 පරිදි සාරාංශ ගතකල හැක.

**වගු අංක 1**

| තෘණ විශේෂය | මාස 15ක කාල සීමාවකදී ලබා දුන් වියලි බර (මෙ: ටො:/හෙක් :) | |
|---|---|---|
| | පත්‍ර | මුල් |
| හයිබ්‍රිඩ් නේපියර් | 64.0 | 7.9 |
| ගෞතමාලා | 31.7 | 3.98 |
| ලෙමන් ග්‍රාස් | 22.0 | 1.7 |
| මානා | 19.5 | 1.6 |

මේ අනුව නේපියර් තෘණ වගාකිරීම තුලින් මානා හා ගෞතමාලා තෘණවලට වඩා ඉතා වැඩි පත්‍ර හා මුල් අස්වැන්නක් ලැබෙන බව පැහැදිළියි. එමෙන්ම ලෙමන් ග්‍රාස් වලින් ලබාදෙන වියලි ද්‍රව්‍ය ප්‍රමාණය මානාවලට සමාන බවද පෙනේ.

මෙම තෘණ වගා කිරීම නිසා වැඩි දියුණු වු පසේ කාබනික ද්‍රව්‍ය ප්‍රතිශතය පහත වගු අංක 2 හි දැක්වේ.

**වගු අංක 2**

| තෘණ විශේෂය | කාබනික ද්‍රව්‍ය ප්‍රතිශතය |
|---|---|
| හයිබ්‍රිඩ් නේපියර් | 2.5 % |
| ගෞතමාලා | 2.4% |
| ලෙමන් ග්‍රාස් | 2.3% |
| මානා | 2.2% |

ලෙමන් ග්‍රාස්



මේ අනුව වැඩිම කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයක් ලබා දී ඇත්තේ නේපියර් තෘණ මගින් බව පැහැදිලි වේ.

ආචාර්ය කේ. පී. ප්‍රේමතිලක හා එම්. පී. එස්. ලියනගේ

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

THE TEA RESEARCH INSTITUTE OF SRI LANKA

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 10 කාණ්ඩය 1 2013 ජූනි

20 AUG 2014

පසෙහි නයිට්‍රජන් හා පොටෑසියම් ප්‍රතිශතයද තෘණ වගාකිරීම නිසා ඉහළ ගොස් තිබුනි. තවද හයිබ්‍රිඩ් නේපියර් වගාකිරීම නිසා පසෙහි ගැඩවිලි පණුවන්ගේ ගහනය අනෙකුත් තෘණ වර්ග වලට වඩා තෙගුණයකින් ඉහළ ගොස් තිබිනි. මෙසේ මෙම එක් එක් තෘණ විශේෂය ස්ථාපනය කිරීම සඳහා වැය වන වියදමත් ඉන් ලැබෙන ආර්ථික ප්‍රථිලාභ පිළිබඳව කරන ලද විශ්ලේෂණයේ ප්‍රතිඵල පහත වගු අංක 3 හි දක්වා ඇත. ඒ අනුව නේපියර් තෘණ විශේෂයෙන් ලැබෙන වාසි අන් තෘණ විශේෂ වලට වඩා ඉතා වැඩි බව පෙනේ.

**වගු අංක 2**

| තෘණ විශේෂය | ප්‍රතිලාභ/ වියදම් අනුපාතය |
|---|---|
| හයිබ්‍රිඩ් නේපියර් | 5.12 |
| ගෞතමාලා | 1.78 |
| ලෙමන් ග්‍රාස් | 3.11 |
| මානා | 2.14 |

එබැවින් මෙම පර්යේෂණ දත්ත අනුව හයිබ්‍රිඩ් නේපියර් තෘණ විශේෂය පාංශු පුනරුත්ථාපනය පිණිස වගාකිරීම තුලින් විශේෂ වාසි අත්වන බව පැහැදිලි වේ. වැඩි තෘණ අස්වැන්නක් කෙටි කලක් තුලදී ලබාගැනීමට හැකි නිසා පුනරුත්ථාපන කාලසීමාව මාස 15 ක් දක්වා පමණ කෙටි කර ගැනීමට මෙවැනි තෘණ විශේෂයක් වගා කිරීම මගින් හැකියාව ලැබේ. ලෙමන් ග්‍රාස් විශේෂයද මානා හා සමානව සිය වර්ධන හැකියාවන් ප්‍රදර්ශනය කලේය. එබැවින් ලෙමන් ග්‍රාස් විශේෂයද දැනට මානා සුලභ නොවන හා ගෞතමාලා වගාකිරීමට අවධානමක් ඇති පහතරට ප්‍රදේශ සඳහා නුදුරු අනාගතයේදී නිර්දේශ කිරීමට හැකියාව පවතී.

කෙසේ වෙතත් හයිබ්‍රිඩ් නේපියර් තෘණ විශේෂය මුලින්ම හඳුන්වා දී ඇත්තේ කිරි ගවයින් සඳහා සුදුසු තෘණ විශේෂයක් ලෙසිනි. එබැවින් එය වගාකිරීමේදී නිදැල්ලේ හැසිරෙන ගවයින් ගේ උලාකෑමට පාත්‍රවීමට හෝ නැතිනම් අනවසරයෙන් තණකොල ලෙස කපා ගෙන යාමට ඉඩ ඇති බැවින් පුනරුත්ථාපන කාලය තුල එම වගාවන් ආරක්ෂා කරගැනීමට තේ ඉඩම් හිමියන් පියවර ගතයුතුව ඇත.



ගෞතමාලා